# බෞද්ධ අනාත්මවාදී සංකල්පය පිළිබඳ විමසුමක්

- දිවුලපැලැස්සේ විමලානන්ද හිමි

## හැඳින්වීම

බෞද්ධ දර්ශනයේ ආත්ම විරෝධී සංකල්පය වනාහි ප්‍රාග් බෞද්ධ දාර්ශනිකයන් අතරත් සමකාලීන දර්ශන සම්ප්‍රදායයන් අතරත් සුවිශේෂී ඉගැන්වීමකි. 'අත්ත' යන්නෙහි වාච්‍යාර්ථයෙන් සදාකාලික වූ, සනාතන වූ, අවිපරිණාම වූ, නිත්‍ය වූ, ධ්‍රුව වූ, නොවෙනස්වන සුළු කිසිවක් පවත්නා බව ඉදිරිපත් කෙරේ. දේවවාදී ආගම්වල සදාකාලික වූ ආත්මයක් ඇති බව උගන්වයි. ආත්මවාදී ආගම්වලට අනුව මිනිසාගේ සියලු කායික, වාචසික හා මානසික ක්‍රියාවන් සිදුකරනුයේ 'ආත්මය' විසින් බවත් එනිසා 'ආත්ම' යන්නෙන් ස්වයං ප්‍රවෘත්ත වූ, ස්වසංවේද්‍ය වූ, සදාකාලික වූ, සනාතන වූ ගුණයන්ගෙන් හෙබි අවිපරිණාත්මක නිත්‍යත්වයක් අර්ථවත් කරයි. මෙබඳු මතවාදයන්ට නතු නොවී නිදහස් චින්තනය අගය කරමින් අවිද්‍යාන්ධකාරය නසාලමින් අනාත්මවාදී දර්ශනයක් ඉදිරිපත් කළ මූලික දර්ශනය බෞද්ධ දර්ශනයයි. පටිච්චසමුප්පාද ධර්මතාව බලපවත්වන ලෝකයෙහි සියලු ධර්මයන් පටිච්චසමුප්පන්න බව බුදුරජාණන් වහන්සේ වදාළහ. ලොව සදාකාලිකව අවිනශ්වරව පවත්නා නිත්‍යත්වයක් නොමැති බව උන්වහන්සේගේ ඉගැන්වීමයි. ප්‍රතීත්‍ය සමුප්පන්න සාපේක්ෂතාව බලපවත්වමින් සංස්කෘත ධර්මයන් අතර (සබ්බෙ සංඛාරා අනිච්චා)[1] මෙන්ම අප්‍රතීත්‍ය සමුත්පන්න වූ අසංස්කෘත ධර්මයන් තුළ ද (සබ්බෙ ධම්මා අනත්තා)[2] නිත්‍ය වූ අවිපරිණාම වූ තත්වයක් හෝ ස්වභාවයක් නොමැති බවත් එනිසාම 'ආත්ම' යන්නක් නොමැති බව පසක් කරමින් 'අනාත්මවාදයක්' ඉදිරිපත් කරයි.

## ප්‍රාග් බෞද්ධ ආත්මවාදය

ඍග්වේද යුගයේ අවිනශ්වර, අවිපරිණාම ආත්මවාදයක් විශ්වාස කෙරුණු අතරම 'ජගදාත්මය සහ ප්‍රත්‍යගාත්මය' යනුවෙන් දෙඅංශයකින් අර්ථ ගන්වා ඇත. උපනිශද් දර්ශනයෙහි කර්මය, පුනර්භවය, නිර්වාණය ආදී සෑම ඉගැන්වීමකටම පදනම වී ඇත්තේ ආත්ම දෘෂ්ටියයි. උපනිෂද් මතය වනුයේ ෂඩ් ඉඳුරන්ගේ ක්‍රියාකාරිත්වය ඇති කරවන ආත්මයක් ඇති බව නමුත් බෞද්ධ දර්ශනයේ සඳහන් වන්නේ මිනිසාගේ ත්‍රිවිධද්වාරාගත සියලු ක්‍රියාවන්ට මනස මූලිකව පවතින බවයි.

**'මනො පුබ්බංගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා**
**මනසා චෙ පදුට්ඨෙන - භාසතිවා කරොතිවා....'**[3]

උපනිෂද් දාර්ශනිකයන්ගේ නිගමනය වූයේ **'ආත්මය'** යනු නිත්‍ය වූ, අවිපරිණාත්මක වූ, නික්ලේෂී වූ මිනිසාගේ **'භෞතික කය'** යන්නයි. ඔවුහු 'ජාගර, ස්වප්න, සුෂ්ජන, තුරිය' යනුවෙන් අවිපරිණාම වූ නිත්‍ය වූ ආත්මයෙහි අවස්ථා 04ක් දක්වති. ඓතරේය උපනිෂදය 'පඤ්ච විධ කෝෂය' යනුවෙන් ආත්මය පස් අයුරකින් විද්‍යාමාන වන බව සඳහන් කරයි.

I. **අන්නමය කෝෂය** - ආත්මයාගේ බාහිර කොටසයි. භෞතික ශරීරයයි.
II. **ප්‍රාණමය කෝෂය** - ආහාරයෙන් පෝෂිත භෞතික ශරීරාභ්‍යන්තරයෙහි පවත්නා දෙවෙනි ආත්මයයි.
III. **මනෝමය කෝෂය** - ඉන්ද්‍රියඥාන ප්‍රභවයේ දී පූර්වංගම වන තෙවන ආත්ම ස්වරූපයයි.
IV. **විඥානමය කෝෂය** - සත්‍යාවබෝධය ලබාදෙන සිව්වන ආත්ම ස්වරූපයයි.
V. **ආනන්දමය කෝෂය** - පරමාර්ථ සත්‍යය මෙයයි. මේ තත්වයට පත් මිනිසා 'බ්‍රහ්මන්' බවට හෙවත් 'බ්‍රහ්ම සහව්‍යතාවයට' පැමිණියේ වෙයි.[4]



ජෛන දර්ශනයෙහි ආත්මවාදය **ජීව** කොටස වශයෙන් දක්වයි. ඇතාගේත්, ගවයෙකුගේත්, මිනිසෙකුගේත්, කුහුඹුවකුගේත් ඒ ඒ ශරීර තරමට **'ආත්මය'** ලොකු කුඩා වන බව ඔවුන්ගේ ඉගැන්වීමයි. භෞතිකවාදීහු ද ජීවය හා ශරීරය එකක් බව පිළිගත්හ. (**තං ජීවං, තං සරීරං**) මෙම විවරණයට අනුව **'ආත්මවාදය'** වශයෙන් ඉදිරිපත් කර ඇති බව පැහැදිලිය. එහෙත් මේවා මනුෂ්‍ය ජීවිතයේ පහසුව සඳහා මිනිසා ඇතිකර ගන්නා ප්‍රඥප්ති මාත්‍ර බවත්, මිනිසා පවා එම ගණයට අයත් බවත් පාරමාර්ථික වශයෙන් එබඳු තත්වයක් නොමැති බවත් ලොවට පැහැදිලි කළේ බුදුරජාණන් වහන්සේය.[5]

## බෞද්ධ අනාත්මවාදය

ආත්මවාදය ප්‍රතික්ෂේප කිරීමට ප්‍රතීත්‍ය සමුප්පාදය, පඤ්චස්කන්ධ ධර්මය, පුද්ගල සංකල්ප නිරායාශ, අනාත්මවාදී දර්ශනය ආදී ක්‍රම කිහිපයක් බුදුන් වහන්සේ උපයෝගී කොටගෙන ඇත. ප්‍රතීත්‍ය සමුප්පන්න වූ විශ්වයෙහි සියලු සංස්කෘත ධර්මයන් විෂයෙහි **'අනිත්‍ය, දුක්ඛ, අනාත්ම'** යන ත්‍රිලක්ෂණය බලපායි. සියලු සංස්කෘත ධර්ම මොහොතින් මොහොත වෙනස් වෙයි. එසේ වෙනස්වන ධර්මයන් තුළ නොවෙනස්වන කිසිදු පදාර්ථයක් නොවිය හැකි බව බුදුරජාණන් වහන්සේගේ නිගමනයයි.

**'එසොව මග්ගො නත්ථඤ්ඤො - දස්සනස්ස විසුද්ධියා.....'**[6]
**'එතං හි තුම්හෙ පටිපන්නා - දුක්ඛස්සන්තං කරිස්සථ.....'**[7]
**'තුම්හෙ හි කිච්චං ආතප්පං - අක්ඛාතාරො තථාගතො.....'**[8]

විශ්වයේ පවතින සෑම දෙයක් ම හේතු සමූහයකින් උපන් නිසා (යෙ ධම්මා හේතුප්පභවා, තෙසං හෙතු තථාගතො ආහ)එබඳු කිසි ධර්මයක අවිපරිණාත්මක, සනාතන ධර්මයක්, ආත්මයක් නොමැති බව බෞද්ධ මතයයි. ලොව පවතින සියලු ධර්මයන් ප්‍රතීත්‍ය සමුප්පන්නව පවතින බව පසක් කිරීම සඳහා බොහෝ නිකායාගත සූත්‍රයන් මගින් විවිධ අරමුණු කෙරෙහි එය උපයෝගී කොට ගෙන ඇත. 'අනාත්මවාදය වනාහි

පඤ්චස්කන්ධ විභාගයත් ප්‍රතීත්‍ය සමුප්පාද දේශනාවත් පිළිබඳ උපසිද්ධාන්තයකි. එය ඒ දෙක මුල්කොට ඇත්තේ වෙයි.'[9]

දුක්ඛ සත්‍යයෙහි දුක පිළිබඳ කරුණු විවරණයේ දී පුද්ගලයා යැයි අප සලකනුයේ පඤ්චස්කන්ධයාගේ එකතුව බව පැහැදිලි කෙරෙයි. ඒ පඤ්චස්කන්ධය විභාග කර බැලීමේ දී 'මම' කියා හෝ 'ආත්මය' කියා හෝ නොවෙනස් වන සුලු කිසිදු දෙයක් නොමැති බව පෙනෙයි. පටිච්චසමුප්පාදයෙනුදු විස්තර කරනුයේ වෙනත් දේවල් හා සම්බන්ධ නොවන නිත්‍ය, පරම කිසිදෙයක් නොමැති බවයි. අනාත්මවාදය ගැන තේරුම් ගැනීමට ඉවහල් වන පටිච්චසමුප්පාද ධර්මය සූත්‍රයන්හි සංක්ෂේප කොට ඇත්තේ මෙසේය.

'**ඉමස්මිං සති ඉදං හොති** - මෙය ඇති කල එය ඇතිවෙයි.'
'**ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති** - මෙය ඉපදීමෙන් එය උපදී.'
'**ඉමස්මිං අසති ඉදං නහොති** - මෙය නැති කල එය නොවෙයි.'
'**ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති** - මෙය නැතිවීමෙන් එය නැතිවෙයි.'

මෙම සිද්ධාන්තය පදනම් කරගෙන ප්‍රතීත්‍ය සමුප්පාදයට අනුව ජීවිතයෙහි පැවැත්මත් නැවැත්මත් විස්තර කර ඇත. අවිද්‍යාව නිසා සංස්කාරයත් (**අවිජ්ජා පච්චයා සංඛාරා**) සංස්කාර හේතුකොට ගෙන විඥානයක් (**සංඛාර පච්චයා විඤ්ඤාණං**) විඥානය හේතුකොට ගෙන නාමරූපත් (**විඤ්ඤාණ පච්චයා නාමරූපං**) ආදී වශයෙන් කරුණු දොළොසක් ඔස්සේ ජීවිතයෙහි හටගැන්ම සහ රැඳීම විස්තර කරයි.[10] විශ්වයෙහි සෑම දෙයක් ම යම්කිසි හේතුවක් නිසා ප්‍රභවය වන බවත් ඒ හේතුව නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කිරීමෙන් ඒ දෙය අහෝසි වන බවත් මෙමගින් බුදුන් වහන්සේ පෙන්වා දුන්හ. '**හෙතුං පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ඣති**'[11] එනම් හේතුව නැති කිරීමෙන් විනා වෙන කිසිදු ක්‍රමයකින්වත් එය නැතිකළ නොහැකි බවත් අහේතුක වූ අප්‍රත්‍ය වූ නොවෙනස් වන කිසිම දෙයක් ලොව නොපවතින බව ප්‍රතීත්‍ය සමුප්පාද ධර්මය මගින් පැහැදිලි කෙරෙයි.



සාති භික්ෂුව නොවෙනස් වන විඤ්ඤාණයක් භවයෙන් භවයට සැරිසරන බවත් ඔහුගේ එම ආත්ම ස්වරූප විඤ්ඤාණවාදය ඛණ්ඩනය කිරීමේ පරමාර්ථයෙන් විඤ්ඤාණය යන්න ප්‍රතීත්‍ය සම්භූත වූ දෙයක් බව ප්‍රකට කිරීමට බුදුරදුන් පටිච්චසමුප්පාද ධර්මය උපයෝගී කරගෙන නොවෙනස් වන ආත්මයක් පිළිබඳ පැවැති දෘෂ්ටිය '**අනෙක පරියායෙන භාවුසො සාති, පටිච්චසමුප්පනං විඤ්ඤාණං වුත්තං භගවතා අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති**'[12] යනුවෙන් ප්‍රතික්ෂේප කරයි.

ආත්ම දෘෂ්ටිය දුකට හේතුව බවත් එසේ දුකට හේතු නොවන ආත්ම වාදයක් වේ නම් එය පිළිගන්නා ලෙසත් උන්වහන්සේගේ ඉගැන්වීමයි. මහාපරිනිබ්බාන සූත්‍රයේ දී ද බුදුන්වහන්සේ 'ආනන්ද මා මහළුය, ශරීරය දිරාගිය ගැලක් බඳුය. එබැවින් ආනන්දය, මා පිළිසරණ කොටගෙන හෝ අන්‍යයෙක් පිළිසරණ කොටගෙන වාසය නොකරන්න. ධර්මය ම සරණ කොටගෙන වාසය කරන්න' යනුවෙන් ධර්මය ම පිහිට කොට වාසය කිරීමට දේශනා කර ඇත්තේ මෙපරිද්දෙනි. '**ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො. ආසීතිකො මෙ වයො වත්ති. සෙය්‍යථාපි ආනන්ද ජජ්ජරසකටං පෙක්ඛමිස්සකෙන යාපෙති,....... අත්තදීපා විහරථ, අත්තසරණා අනඤ්ඤසරණා, ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා.**'[13]

තමාගේ විමුක්තිය තමා විසින් ම සලසා ගතයුතු බව උන්වහන්සේ නොයෙක් අවස්ථාවල දී දේශනා කළහ. '**අත්තාහි අත්තනො නාථො කො හි නාථො පරොසියා**'[14] මෙහි දී 'අත්ත' යන වචනය සම්මුති වශයෙන් පුද්ගලයා හැඳින්වීමට යොදා ගෙන ඇත්තේ 'නොවෙනස් වන පදාර්ථයක්ය' යන අර්ථය දෙන ආත්මවාදයක් අදහස් වීමට නොවේ.

දිනක් වච්ඡගොත්ත බ්‍රාහ්මණයා 'ආත්මයක් ඇත්දැයි' බුදුරදුන්ගෙන් ප්‍රශ්න කරයි. එයට පිළිතුරු නොදී නිශ්ශබ්දව සිටි විට 'ආත්මයක් නැත්දැයි' විමසයි. එයටත් නිශ්ශබ්දව සිටි කළ වච්ඡගොත්ත ඉවත්ව යයි. එහිදී ආනන්ද තෙරුන් අමතා

පවසන්නේ ආත්මයක් ඇතැයි කී නම් ශාස්වත වාදයටත් ආත්මයක් නැතැයි පැවසූයේ නම් උච්ඡේදවාදයටත් වැටෙන බව **'අත්ථි මෙ අත්තාති මාස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති, නත්ථි මෙ අත්තාති වාස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති'**[15] යනුවෙන් සඳහන් කරයි.

බුදුන්වහන්සේ මේ අන්ත දෙකම ප්‍රතික්ෂේප කළහ. ප්‍රතීත්‍ය සමුප්පන්න වූ ලෝකයෙහි අවිපරිණාත්මක වූ ආත්මයක් නොමැති බව උන්වහන්සේ සනාථ කළහ. සියලුම සංස්කාර ධර්මයන් ප්‍රතීත්‍ය සමුප්පන්න වෙයි. අප්‍රතීත්‍ය සමුත්පන්න වන්නේ අසංස්කෘත වූ නිර්වාණ ධර්මය ම පමණි. සචේතනකවූත් අචේතනකවූත් සියලු සංස්කෘත ධර්ම ලෝකය ම ප්‍රභේද ගත කරන විට ඒ සියල්ල 'රූප, වේදනා, සඤ්ඤා, සංඛාර හා විඤ්ඤාණ' යන පහට ඇතුළත් කළ හැකිය. මෙසේ පුද්ගල ප්‍රඥප්තිය වර්ග කොට දක්වන ලද්දේ අවිනශ්වර, නිත්‍ය, පදාර්ථයක්, ආත්මයක් නොමැති බව හෙවත් ඒකත්වය ප්‍රතික්ෂේප කර බහුත්වය අර්ථවත් කිරීමේ පරමාර්ථයෙනි. සියලු දෘෂ්ටි ප්‍රහාණය පිණිස, නිරෝධය පිණිස දහම් දෙසූ බුදුදහමෙහි දෘෂ්ටි ග්‍රහණයට කිසිඳු ඉඩක් නොමැත. 'පඤ්චස්කන්ධය' වශයෙන් ආයතන පහක් **'රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සංඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො ඉමෙ වුච්චන්තාවුසො සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා'**[16] යනුවෙන් බෞද්ධ දර්ශනයෙහි සඳහන් වන්නේ මේ නිසයි.

රූපය ආත්මය වශයෙන් ගතහොත් ලෙඩ රෝග නොවැළඳිය යුතුය. ශරීරය නොවෙනස් විය යුතුය. ජරාවට පත් නොවිය යුතුය. එහෙත් එය එසේ සිදුනොවන නිසා එහි ආත්මයක් ඇතැයි කිව නොහැකිය. අනිකුත් ඉඳුරන්ගේ ස්වභාවය ද මෙසේමය. අනත්තලක්ඛණ සූත්‍රයට අනුව 'රූප, වේදනා, සඤ්ඤා, සංඛාර හා විඤ්ඤාණ' යන එකක් හෝ අවිනශ්වර වූ ආත්මය වශයෙන් ග්‍රහණය කළ යුතු දෙයක් නොවන බව **'සබ්බං භික්ඛවෙ අනත්තා, කිඤ්චි භික්ඛවෙ සබ්බං අනත්තා, සොතං...ජිව්හා....'**[17] යනුවෙන් පැහැදිලි කෙරෙයි.



බුදුන් වහන්සේ සහ සච්චක අතර ආත්මය ගැන විවාදයේ දී 'රූපය හෝ වේදනාව හෝ සඤ්ඤාව හෝ සංඛාර හෝ විඤ්ඤාණය හෝ ගෙන මෙය මාගේ ආත්මයය, මෙය මාගේ ආත්මය නොවේ' ආදී වශයෙන් ප්‍රකාශ කළ නොහැකි බවත් පඤ්චස්කන්ධය ම 'අනිත්‍ය, දුක්ඛ, අනාත්ම' යන ලක්ෂණයන්ගෙන් යුක්ත වන බවත් අවධාරණය කරයි. එනම් **'රූපං නිච්චං වා අනිච්චං වාති, අනිච්චං භො ගොතම. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භො ගොතම. යං පනානිච්චං දුක්ඛං, විපරිණාමධම්මං කල්ලන්නුතං සමනුපස්සිතුං, එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තාති. නො හිදං භො ගොතම'**[18] වශයෙනි.

වේදනා, සඤ්ඤා, සංස්කාරාදිය ද ප්‍රතීත්‍ය සමුප්පන්නය. ප්‍රතීත්‍ය සමුප්පන්න ධර්මයන්ගේ ස්වභාවය අනිත්‍යාදි ත්‍රිලක්ෂණයයි. එය මොහොතින් මොහොත වෙනස් වෙයි. විසුද්ධි මග්ගයට අනුව ද **'පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං භගවතා අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති'**[19] යනුවෙන් 'සංස්කාරය සකස් කරන ලද්දක් බැවින් සංස්කාර නම් වේ,' විඤ්ඤාණය ද ප්‍රතීත්‍ය සමුප්පන්නය.

ප්‍රතීත්‍ය සමුප්පන්නව හටගන්නා විඤ්ඤාණයෙහි ද 'ආත්ම' වශයෙන් ගතහැකි නිත්‍ය ස්වභාවයක් නැත. අවසන් වශයෙන් නිගමනය කළ හැක්කේ නිත්‍ය වූ 'ආත්ම' ස්වභාවයක් ස්කන්ධ ධර්මයන්හි ද නොමැති බවයි. ලෝක ස්වභාවය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයයි. 'යමක් අනිත්‍ය ද එය දුකයි. යමක් දුක ද එය අනාත්මයි'[20] ආත්ම දෘෂ්ටිය මිනිස් සන්තානයෙන් බැහැර කරන බුදුන් වහන්සේ ආත්මයක් හෝ ආත්මනීය දෙයක් හෝ පඤ්චස්කන්ධයෙහි හෝ ඉන් බාහිරව නොමැති බව **'රූපං භික්ඛවෙ අනිච්චං, වෙදනා අනිච්චං, සඤ්ඤා අනිච්චං, සංඛාරා අනිච්චං, විඤ්ඤාණං අනිච්චං, රූපං භික්ඛවෙ අනත්තා,...... සබ්බෙ සංඛාරා අනිච්චා, සබ්බෙ ධම්මා අනත්තාති'**[21] යනුවෙන් අවධාරණය කළහ.

ස්කන්ධ එකතු වී සෑදෙන වස්තුවට අප 'පුද්ගල' යන නාමය භාවිත කරන බැවින් ඇතැමෙක් බුදුදහම ආත්ම වාදය පිළිගන්නා බව විශ්වාස කරති. සියලු අංශයන්ගෙන් යුක්ත වූ විට රථය කියන්නාක් මෙන් ස්කන්ධ ධර්මයන්ගෙන් සමන්විත වූ කළ සත්වයා හෝ පුද්ගලයා යැයි ව්‍යවහාර කෙරේ. එහෙත් එයට ද උපත, පැවැත්ම සහ මරණය ප්‍රත්‍යක්‍ෂ බැවින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්‍ෂණය සාධාරණ වෙයි. එනිසා පුද්ගලත්වය ත්‍රිලක්‍ෂණයට යටත් වන්නාක් මෙන් සියලු ඉඳුරන් ද වේදනාදී නාමස්කන්ධයන් ද අනිත්‍යාදී ලක්‍ෂණයන්ට යටත්ව පවතින අතර 'පුද්ගල' යනු ප්‍රඥප්තියක් පමණකි.

කර්මය හා පුනර්භවය බෞද්ධ දර්ශනයේ මූලික සිද්ධාන්තයකි. උපනිෂද් දර්ශනයෙහි ද මෙම ඉගැන්වීම ඇතුළත්ය. එහෙත් එහි පදනම ආත්මවාදයයි. ඒ අනුව පිළිගැනෙන්නේ කර්ම කරන්නා මෙන්ම විපාක විඳින්නා ද අනන්‍ය වන බවයි. එනම් 'ආත්මයෙන් ආත්මයට සංක්‍රමණය වන පුද්ගලයෙක් සිටී. කර්මය කරන්නා හා එහි විපාක විඳින්නා ඒ පුද්ගලයා හා සමානය'. එහෙත් බුද්ධවචනයට අනුව භවයෙහි සැරිසරන්නේ එබඳු එකම පුද්ගලයෙක් නොවේ. 'සංසාරය යනු අවිපරිණාත්මක වූ ප්‍රවෘත්තියක් නොවේ. විපරිණාත්මක ස්වභාවයකි. එනිසා සංසාරය යනු පඤ්චස්කන්ධ ධර්මයෙහිත් අටළොස් ධාතූන්ගෙත් ද්වාදශායතනයන්හිත් අවිච්ඡින්න වූ ප්‍රවර්තනයකි.'[22]

මෙසේ බුදුගොස් හිමියන් දක්වනුයේ සිද්ධ වූ ධර්මයන්ගේ ප්‍රවර්තනයක් මිස පාරමාර්ථික වශයෙන් ප්‍රවෘත්තමාන වන්නා වූ පුද්ගලයෙක් නොමැති බවයි. පුද්ගලයා තුළ ආත්මයක් ඇතැයි සිතීම අවිද්‍යාව නිසා ඇති වන්නෙකි. සබ්බාසව සූත්‍රයට අනුව යමක් අවිපරිණාමාත්මකව පවතී නම් පිළිගැනීමක් ඇතිවනුයේ අවිද්‍යාව මුල්කොට ගෙන බව '**මෙ අයං අත්තා නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව ඨස්සතීති**'[23] යනුවෙන් පෙන්වාදෙයි.



බුද්ධඝෝෂ හිමියන් විසුද්ධිමග්ගයේ දී භවයෙහි දුකක් මිස දුක් විඳින පුද්ගලයෙක් නොමැති බවත් තමා 'ආත්මය' වශයෙන් හඳුනන යම්කිසි දෙයක් (ධර්මයක්) ඇත් ද, එය වෙනත් දේ මත රඳා පවත්නා බවත් පැහැදිලි කරයි. තවද, පෘථග්ජනයා විසින් 'ආත්මය' වශයෙන් සලකනු ලබන දේ සංස්කාරයන්ගෙන් ප්‍රත්‍ය වූ සංඛත ධර්මයන් බව පෙන්වා දෙයි. (**සංඛතං අභිසංඛරොන්ති**) 'මෙම ආත්මය වශයෙන් ගන්නා වූ සංඛත ධර්මයට අවශ්‍ය ප්‍රත්‍ය වූ මේ සංස්කාර අනිත්‍යය. (**සබ්බෙ සංඛාරා අනිච්චා**)තම ආත්මය වශයෙන් ගන්නා ධර්මය රඳා පවත්නා වූ සංස්කාර අනිත්‍ය බව දක්නා කළ තම 'ආත්මය' වශයෙන් ගන්නා ධර්මය ද අනිත්‍ය බව දකී. එම අනිත්‍ය ස්වභාවය නිසා ඒ ආත්මය වශයෙන් ගත් ධර්මය ඇළුම් කටයුතු දෙයක් නොවේ. මේ අනුව ඉතිරි වනුයේ ඇළුම් කටයුතු නොවන අනිත්‍ය වූ ආත්මයක් පමණකි. නිත්‍ය නොවන්නේ නම් ආත්ම ස්වභාවයක් නැත. මෙයින් අවබෝධ වන්නේ 'ආත්මය' වශයෙන් හඳුනාගත් ධර්මය දැන් 'ආත්මයක්' නොවන බවය. 'ආත්මය' වශයෙන් ගත් දේ නොහොත් ධර්මයට අනුව 'අනාත්ම' (**සබ්බෙ ධම්මා අනත්තා**) බව දකී.

බුදුදහමේ අනාත්මවාදී සංකල්පය දෙස දාර්ශනිකව විමසීමේ දී හේතුඵලවාදයේත් විභජ්ජවාදයේත් අනුභූතිවාදයේත් ප්‍රතිඵලයක් ලෙස පෙනේ. ආත්මවාදීහු පුනර්භවය තේරුම් ගැනීමට අවිච්ඡින්නව පවත්නා ආත්මයක් අවශ්‍ය බවත් කර්මය තේරුම් ගැනීමට කාරක, වේදක ආත්මයක් පිළිගැනීම අවශ්‍ය බවත් විශ්වාස කළහ. එහෙත් බුදුසමයේ පුනර්භවය හා කර්මය තේරුම් කරනුයේ පුද්ගලයාගේ පැවැත්මට හේතුවන අන්‍යෝන්‍ය බලවේගයන්ගේ බලපෑම් විදහාපාන ප්‍රතීත්‍ය සමුප්පාද ධර්මයෙනි. 'උපනිෂද් ග්‍රන්ථයන්හි ආත්ම පදාර්ථය නිත්‍ය, සුඛ, අන්තර්ගාමී ලක්‍ෂණ ඇතියක් ලෙස සැලකූ බව පෙනේ. බුදුසමයෙහි අනාත්මවාදය දේශනා කර තිබෙන්නේ මෙවැනි ලක්‍ෂණ ඇති කිසිවෙක් ලෝකයේවත් පුද්ගලයාතුළවත් නැති බව පෙන්වා දෙමිනි.'[24]

'ආත්මය' 'මම' ආදි කවර නමකින් වුව ද දක්වනු ලබන වෙනස් නොවන, සදාකාලික අමර වස්තුවක් මිනිසා තුළ හෝ බැහැර හෝ ඇතැයි සිතීම මිථ්‍යා විශ්වාසයක් බව ප්‍රතීත්‍ය සමුප්පාද ධර්මයෙන් ද පඤ්චස්කන්ධ විභාගයෙන් ද දක්වනු ලැබෙයි. මේ වනාහි බුදුන් වහන්සේ වදාළ'අනාත්ම' ධර්මයයි.

බුදුදහමේ අනාත්ම වාදය මගින් ආත්මයක් නැතැයි දැක්වූවා මිස පුනර්භවයක් නැතැයි කීවේ නැත. බමුණන්ගේ ආත්මවාදයට එරෙහිව බුදුදහම අනාත්මවාදයක් පෙන්වූවා මිස බුදුදහම අනාත්මයක් ගැන කීමට පහළ කළ වාදයක් නොවේ. එය හේතුඵල වාදයකි, පටිච්චසමුප්පන්න වාදයකි. 'ආත්මවාදයට පහර ගැසූ ගෞතම තථාගතයන් වහන්සේ වදාළේ වෙනස් නොවන කිසිම තත්වයක් සත්වයා තුළ නැති බවත් ඔහු තුළ සෑම නාම ධර්මයක් මෙන් ම සෑම රූප ධර්මයක් ම ක්ෂණික පරිවර්තනයකට භාජනය වෙමින්, ඇතිව නැවත හටගැනීමේ පාරම්පරික සම්බන්ධයකින් යුක්තව යන ධර්ම පරම්පරාවක් බවත්ය. එය හේතුඵල ධර්ම පරපුරකි. 'පටිච්චසමුප්පාද' යන නමින් බුදුන් වහන්සේ විසින් වදාරණ ලද සත්වයාගේ ඒ භවගාමී ස්වරූපය මේ වන තුරු නොබිඳිය හැකි වූ ද එපමණක් නොව දිනෙන් දින නිදසුන් නිසා සත්‍යයක් බව පැහැදිලි වන්නා වූ ද තත්වයකි.[25]

බුදුන් වහන්සේ අනත්තලක්ඛණ සූත්‍රයේ දී ආත්ම සංකල්පය බැහැර කරනුයේ පුද්ගලයා දරන ශරීරය කොටස් කර විග්‍රහ කරමින් එහි එක් එක් කොටසෙහි අවිනශ්වර ලෙස පවතින, තමාට රිසි සේ පවත්වාගෙන යා හැකි ආත්ම පදාර්ථයක් හෝ ශරීරාංගයක් නොමැතිව බව ආනුභූතිකව පැහැදිලි කරමිනි. 'මහණෙනි රූපය ආත්මය නොවේ. රූපය අනාත්මයි, රූපය අනාත්ම නම් මේ රූපය ආබාධ පිණිස පවතී. එමෙන්ම රූපය ආත්මය නම් මගේ රූපය මෙසේ විය යුතුය, මෙසේ නොවිය යුතුය, යනුවෙන් කියා තිබිය හැකිවේ.' බුදුරදුන් අනත්තලක්ඛණ සූත්‍රයේ දී පඤ්ච උපාදාස්කන්ධය ම වෙන වෙන ම සලකා එහි ආත්ම වශයෙන් ගත හැකි දෙයක් නැති



බවත් එහි ආත්ම වශයෙන් ගත හැක්කක් ඇත්නම් ඉන් තමාට දුකක් වේදනාවක් නොලැබෙන බවත් පැහැදිලි කරයි.

බුදුන් වහන්සේ ඇතැම් තැනක අනිත්‍යතාව ඇසුරෙන් අනාත්ම ලක්ෂණය ප්‍රකට කරති. ඇතැම් තැනක දුක්ඛතාව ඇසුරෙන් අනාත්ම ලක්ෂණය ප්‍රකට කෙරේ. තවත් දේශනාවල දී අනිත්‍ය, දුක්ඛ යන දෙකින් ම අනාත්ම බව ප්‍රකාශ කෙරේ. මජ්ඣිමනිකායේ ඇතුළත් ඡජක්ක සූත්‍රය අනිත්‍යයෙන් අනාත්ම බව සනාථ කරන්නෙකි.

'යම් කෙනෙකු ඇස ආත්ම යයි කියන්නේ නම් එය වැරදිය. මක් නිසා ද, ඇසෙහි උපත හා විපත (උප්පාද වය) දක්නට ලැබෙන බැවිනි.'[26] මෙසේ ඇසත් රූපයත් චක්ඛු විඤ්ඤාණයත් සම්පර්ශයත් ඒ නිසා ඇති වන හැඟීම් සියල්ලත් ඒ හා සම්බන්ධ වන තණ්හාවත් යන සියල්ලෙහි ම හටගැනීම හා විනාශය දක්නට ලැබෙන බැවින් ඒ කිසිවක් ආත්ම වශයෙන් ගත නොහැකි බවත් මමය, මාගේ ය වශයෙන් ගත නොහැකි බවත් එම සූත්‍රයේ දී පෙන්වා දෙයි.

අලගද්දූපම සූත්‍රයේ දී අනාත්ම ලක්ෂණය පෙන්වා දෙනුයේ අනිත්‍ය හා දුක්ඛ යන ලක්ෂණ දෙක ඇසුරෙන්ය. '**සබ්බං රූපං නෙතං මම, නෙසො හමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං,** 'රූපාදී පඤ්චස්කන්ධය (නෙතං මම) මාගේ නොවේය, (නෙසො හමස්මි) එය මම නොවෙමි, (න මෙසො අත්තා) එය මාගේ ආත්මය නොවේ යැයි මෙසේ මෙනෙහි කරන තැනැත්තා සිත රූපාදී ස්කන්ධයන් කෙරෙහි කළකිරෙයි. කළකිරුණේ රූපාදියෙහි නොඇලෙයි. නොඇලීමෙන් රූපාදිය අත්හැර දමා එයින් මිදෙයි. මිදුණු කල්හි එයින් මිදුණේය යන ඥානය පහළ වෙයි. ජාතිය ක්ෂය විය. බඹසර වැස නිමවන ලද්දේය. ඒ අනුව අර්හත්වය සඳහා මත්තෙහි කළ යුතු අන් දෙයක් නැතැයි දැන ගනී'[27] යනුවෙන් අලගද්දූපම සූත්‍රයේ දී උන්වහන්සේ දේශනා කොට ඇත. මෙසේ බොහෝ දේශනාවල දී අනාත්ම ලක්ෂණය ඍජුවම විස්තර නොකොට අනිත්‍ය, දුක්ඛ ප්‍රකට කිරීම තුළින්

අනාත්ම ලක්‍ෂණයට වඩා අනිත්‍ය දුක්ඛ දෙක අවබෝධ කරවීම පහසු බව තේරුම්ගෙන ඇත. අනාත්ම ලක්‍ෂණයෙහි ගැඹුරු බව ද එයින් පැහැදිලි වේ.

අරහන්ත, අලගද්දූපම වැනි සූත්‍ර මගින් රූපාදි ස්කන්ධ සියල්ලෙහි ම සදාකාලික, ස්ථිර, නිත්‍ය නොවන බව පසක් කරලීම තුළින් කිසිදු ආත්ම දෘෂ්ටියක් නොදකින බව බුදුන් වහන්සේ පෙන්වා දෙයි. බෞද්ධ අනාත්ම වාදය වනාහි දාර්ශනික ඉගැන්වීමකි. එය දාර්ශනික වන්නේ මිනිසුන්ට සාමාන්‍ය බුද්ධියකින් ඉතා සරලව දැකිය නොහැකි බැවිනි. මිනිසුන් දැඩිව අල්ලා ගන්නා ආත්ම සංකල්පය නිතර නිතර මතුව එන හෙයින් එය මැඩ පවත්වන, මතු පිටින් නොපෙනෙන යථාර්ථය දැකිය යුතු නිසා ද පැටලිලි රහිතව අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාවය පිළිවෙලින් දැකිය යුතු හෙයින් ද අනාත්ම වාදය දාර්ශනික සිද්ධාන්තයකි. පෙර'පර දෙදිග මෙන් ම දාර්ශනික හා ආගමික ධාරාවන් අතර බුදුදහම සුවිශේෂී වන්නේ ද මේ යථාර්ථ දර්ශනය නිසාමය. අලගද්දූපම සූත්‍රයේ දී යමක් තමන්ගේ නොවේ නම් එය බැහැර කළයුතු බවත් රූපාදියෙහි ඇල්ම දුරුකිරීම තුළින් බොහෝ කලක් හිත සුව පිණිස වන බවත් පෙන්වා දෙයි. 'රූප, වේදනා, සඤ්ඤා, සංඛාර හා විඤ්ඤාණ යන ස්කන්ධ පස ම පිළිබඳව මෙය මාගේ නොවෙයි, මේ මම නොවෙමි, මේ මාගේ ආත්මය නොවේ, යැයි තත් වූ පරිදි මනා නුවණින් දත යුතු යැයි බුදුන් වහන්සේගේ ඉගැන්වීමයි.'[28]

එක් අවස්ථාවක ගැමියෙකුගේ වේශයෙන් බුදුරදුන් හමුවට පැමිණි මාරයා ඇසූ පැනයකට පිළිතුරු වශයෙන් බුදුන් වහන්සේ වදාළේ මෙබන්දකි.

**'රූපං වෙදයිතං සඤ්ඤං විඤ්ඤාණ යඤ්ච සංඛතං**
**නෙසො හමස්මි නෙතං මෙ එවං තත්ථ විරජ්ජති'[29]**



එනම් 'රූපය, වේදනාව, සඤ්ඤාව, විඤ්ඤාණය හා යම් සංස්කාරයක් වේද ඒ මම නොවෙමි, එය මාගේ නොවේ, මෙසේ එහි ඇලීමක් නැත' වශයෙනි.

රාහුලෝවාද සූත්‍රයේ දී රාහුල හිමියන් අරහයා බුදුරදුන් දේශනා කරන ලද්දේ ද මෙබඳුම උපදේශ දහමකි. 'රාහුලය, අධ්‍යාත්මික හෝ බාහිර හෝ දළ හෝ සියුම් හෝ හීන හෝ ප්‍රණීත හෝ දුර හෝ ළඟ හෝ අතීත, අනාගත හෝ වර්තමාන, යම් රූපයක් වේ නම් ඒ මාගේ නොවේ. මාගේ ආත්මය නොවෙයි' යන්න **'යං කිඤ්චි රාහුල රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තාති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බන්ති'**[30] යනුවෙන් සඳහන් වේ.

රාහුල සංයුක්තයේ දී ද ආත්මවාදී දෘෂ්ටිය බැහැර කොට ඇති බව පැහැදිලි වේ. දුක යැයි ඇසූ පසු යමක් අනිත්‍ය නම් දුක නම් වෙනස්වන සුළු නම් එය මමය, මාගේය, මාගේ ආත්මය යැයි දක්නට සුදුසු නැති බව පෙන්වා දෙයි.

සෝවාන් මඟට පිළිපන් පුද්ගලයා මුලින් ම බිඳ දමන්නේ කය පිළිබඳ ආත්ම දෘෂ්ටියයි. කයක් ඇති විට පහළ වන ආත්ම දෘෂ්ටිය 'සක්කායදිට්ඨි' නම් වෙයි. අශ්‍රැතවත් තැනැත්තා රූපය ආත්ම වශයෙන් දකී. අරූප ආත්මය රූපවත් කොට හෝ රූපය ආත්මය කෙරෙහි එළවා හෝ ආත්මය රූපය කෙරෙහි එළවා හෝ දකී.' **'රූපං අත්තනො සමනුපස්සති, රූපවන්තානං වා අත්තානං අත්තනිවා රූපං, රූපස්මිං වා අත්තානං........ එවං බො ආවුසො විසාඛ සක්කායදිට්ඨි හොතීති'**[31] යනුවෙන් දක්වා ඇත්තේ එයයි.

එකල විසූ සච්චක බුදුරදුන් දේශනා කළ අනාත්මය පිළිබඳ මතය ඡේදනය කරන්නේ යැයි ඉදිරිපත් වූ අන්‍ය ආගමික වාදියෙකි. ඔහු අරහයා දෙසූ චූලසච්චක සූත්‍රයේ දී ද බුදුන් වහන්සේ අනාත්මවාදී සංකල්පය මනාව විවරණය කරයි. 'රූපය

අනිත්‍යය, වේදනා අනිත්‍යය, සංඥා අනිත්‍යය, සංස්කාර අනිත්‍යය, විඤ්ඤාණ අනිත්‍යය, රූපය අනාත්මය, වේදනා අනාත්මය, සංඥා අනාත්මය, සංස්කාර අනාත්මය, විඤ්ඤාණ අනාත්මය. සියලු සංස්කාර අනිත්‍යය. සියලු ධර්ම අනාත්මය.'[32]

බුදුදහම වනාහි අනාත්ම වාදයක් දේශනා කිරීම පිණිස ම පහළ වූවක් නොවේ. බුදුන්වහන්සේට අවශ්‍ය වූයේ ලෝකයේ හා සත්වයාගේ යථාතත්වය තමා අවබෝධ කරගත් බැවින් **(යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි)** එම දර්ශනය ලොව ප්‍රකට කිරීමටය. තුන්ලොව ජයගත් උතුම් ශාස්තෘවරයෙක් වූ තමන් වහන්සේ, තම ශරීරය දිරාගිය ගැලක් බඳු යැයි පරිනිර්වාණ සූත්‍රයේ දී කළ ප්‍රකාශයෙන් එතෙක් භාරතයේ පහළ වූ ශාස්තෘවරුන් ආත්මය යැයි හැඳින් වූ ශරීරය 'අනාත්ම' බව සාධක සහිතව පෙන්වාදීම ප්‍රශස්තය.

**සමාලෝචනය**

බුදුරජාණන් වහන්සේ බොහෝ සූත්‍ර දේශනාවන්හි දී **'අත්ත'** යන්න භාවිත කොට තිබීමෙන් ඇතැම් පිරිස් බුදුදහම ආත්මවාදී දහමක් බව අදහස් පළකරයි. එහෙත් **'අත්ත'** යන්න සම්මුති වශයෙන් ව්‍යවහාරයේ පහසුවට මිස ආධානග්‍රාහීව ආත්මයක් ගැන ත්‍රිපිටකාගත සූත්‍රවලින් විවරණය වූයේ නොවේ.

**'අත්තදීපා විහරථ අත්ත සරණා, අත්තනාව කතං පාපං අත්තනා සංකිලිස්සති, අත්තාහි අත්තනො නාථො, අත්තාහි අත්තනො ගති'** ආදි තැන්වලින් ඒ බව පැහැදිලි වේ. දාර්ශනික වශයෙන් සලකා බලන විට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය පිළිබඳ විදර්ශනා ඥානයෙන් ඇති කරගන්නා වූ අවබෝධය යනු නාම රූප ධර්මයන්ගේ යථා ස්වභාවය අවබෝධ කරගැනීමයි. එම අවබෝධය නිසා නාම රූප ධර්ම කෙරෙහි නොඇලෙයි. ඒ පිළිබඳව පැවැති තෘෂ්ණාව දුරුවෙයි. තෘෂ්ණාව මුළුමනින්ම දුරු වූ කල්හි මතු භවයෙහි නාම රූප ධර්මයන් හට නොගනී. මෙසේ වීමෙන් දුකින් මිදීම සිදු වෙයි. පඤ්චස්කන්ධය ආදී සියලු ධර්මයන් අනාත්ම යැයි යම් කලෙක විදර්ශනා



නුවණින් දක්නේ ද එකල්හි සසර දුකෙහි කළකිරෙයි. මෙම කළකිරීම විසුද්ධියට හෙවත් නිවනට මග බව ධම්මපදයේ විග්‍රහිතය.

**'සබ්බෙ ධම්මා අනත්තාති යදා පඤ්ඤාය පස්සති**
**අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා'**[33]

බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ දී සියලුම ධර්මයන් සංඛත ධර්ම සහ අසංඛත ධර්ම වශයෙන් කොටස් දෙකකට බෙදයි. සංඛත ධර්ම යනු වෙනත් දේවල් ප්‍රත්‍ය කොටගෙන සකස් කොටගත් ඒවා වශයෙනුත් අසංඛත ධර්ම යනු රාගක්ෂය, මෝහක්ෂය, දෝසක්ෂය කළ උතුම් රහත් භාවයයි. සංඛත ධර්ම වනාහි උපත, නැසීයාම හා වෙනස් භාවයකට පත්වීම ස්වභාවය කොට ඇති බව ද අවධාරණය කරයි. **'තීණිමානි භික්ඛවෙ සංඛතස්ස සංඛතලක්ඛණානි, කතමානි තීණි, උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්ථං පඤ්ඤායති.'**[34]

බුදුරජාණන් වහන්සේ 'සියලු සංස්කාර අනිත්‍ය බවත් **(සබ්බෙ සංඛාරා අනිච්චා)** අනිත්‍ය වූ එකී සියලුම සංස්කාර ධර්ම දුක් බවත් **(සබ්බෙ සංඛාරා දුක්ඛා)** සියලු ධර්මයෝ අනාත්ම බවත් **(සබ්බෙ ධම්මා අනත්තා)** දේශනා කළහ. මෙහි දී ප්‍රත්‍යයන් නිසා හටගන්නා එකිනෙකට බැඳී පවත්නා කායික මානසික සියලුම දේවල් සංඛාර වචනයෙන් ද පඤ්චස්කන්ධය තුළ හෝ ඉන් බැහැර හෝ නිර්වාණය ඇතුළුව ලෝකෝත්තර ධර්මයක් හෝ ආත්මයක් නැති බව පසක් කිරීමට **'ධම්මා'** යන වචනය ද යොදා ගනී.'[35]

බුද්ධ දේශනාවට අනුව 'මට ආත්මයක් නැත' යන්න උච්ඡේද වාදයට ද 'මට ආත්මයක් ඇත' යන්න ශාස්වත වාදයට ද ඇතුළත් වන බව ඉගැන්වේ. 'අනාත්මවාදය' පිළිබඳ පිළිපැදිය යුතු වන්නේ කිනම් හෝ දෘෂ්ටියක් හෝ වාදයක් දැඩි කොට විශ්වාසයට නොගෙන සියල්ල ඇති සැටියට යථාභූත ලෙස දැන ගැනීමට උත්සුක වීමයි. මම කියා හෝ සත්වයා කියා හෝ අප

සිතනුයේ අන් කිසිවෙක් නොව නාම රූපයන්ගේ භෞතික මානසික ස්කන්ධයන්ගේ සමවායක් බවත් එය හේතු ඵල ධර්මයට යටත්ව මොහොතින් මොහොත වෙනස් වීම්වලට නතුවෙමින් ක්‍රියා කරන්නක් බවත් නිත්‍ය, සදාකාලික, ශාස්වත, වෙනස් නොවන සුලු කිසිවන් ලොව නැති බවත් අවබෝධ කරගැනීමය. 'අනාත්ම ධර්මය' වනාහි මිථ්‍යා විශ්වාස නැමැති අඳුර මුලිනුපුටා දමා ප්‍රඥාව නැමැති ආලෝකය ගෙන දෙන්නා වූ සුවිශේෂී වූ ධර්මයක් ම වෙයි.

## ආන්තික සටහන්


1. බුද්දකනිකාය I, ධම්මපදය, මග්ගවග්ග, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 277 ගාථාව, 94 පිටුව.
2. එම., 279 ගාථාව, 94 පිටුව.
3. එම., 1,2 ගාථා, 1 පිටුව.
4. සෝමරංසි හිමි, උඩගලදෙණියේ, බෞද්ධ දර්ශනය හා සමාජ දර්ශනය, සමයවර්ධන පොත්හල කොළඹ 10, 1999, 61 - 83 පිටු.
5. එම.,
6. බුද්දකනිකාය I, ධම්මපදය, මග්ගවග්ග, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 274 ගාථාව, 92 පිටුව.
7. එම., 275 ගාථාව, 92 පිටුව.
8. එම., 276 ගාථාව, 94 පිටුව.
9. රාහුල හිමි, වල්පොල, බුදුන් වදාල ධර්මය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ I, 1965, 74 පිටුව.
10. මජ්ඣිමනිකාය, මහාතණ්හාසංඛයසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 612-613 පිටු.
11. සංයුක්තනිකාය, සගාථවග්ග, සෙලාසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 244 පිටුව.
12. මජ්ඣිමනිකාය, මහාතණ්හාසංඛයසුත්ත, 602-3 පිටු.
13. දීඝනිකාය II, මහාපරිනිබ්බානසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 158-9 පිටු.
14. බුද්දකනිකාය I, ධම්මපදය, අත්තවග්ග, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 160 ගාථාව.
15. මජ්ඣිමනිකාය, මූලපරියායවග්ග, සබ්බාසවසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 22-3 පිටු.
16. දීඝනිකාය, මහාවග්ග, මහාසතිපට්ඨානසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 486 පිටුව.
17. සංයුක්තනිකාය, සබ්බානිච්චවග්ග, අනත්තසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 62-3 පිටු.
18. මජ්ඣිමනිකාය, මහායමකවග්ග, චූලසච්චකසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 552-3 පිටු.





19. මජ්ඣිමනිකාය, මහායමකවග්ග, මහාතණ්හාසංඛයසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 602-3 පිටු.
20. මජ්ඣිමනිකාය, මහායමකවග්ග, චූලසච්චකසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 552-3 පිටු.
21. එම., 542-3 පිටු.
22. සිංහල විශුද්ධිමාර්ගය, සංස්. මාතර ධම්මවංස හිමි, මාතර වෙළෙන්දෝ, 1957, 319-20 පිටු.
23. මජ්ඣිමනිකාය, මූලපරියායවග්ග, සබ්බාසවසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 22 පිටුව.
24. සිංහල විශ්වකෝෂය, පළමු කාණ්ඩය, ඩී.ඊ. හෙට්ටිආරච්චි, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1963, 341-343 පිටු.
25. ඥානසීහ හිමි, හේන්පිටගෙදර, ලෝකය, පාතකඩ අනුර මුද්‍රණාලය, 1968, 20 පිටුව.
26. මජ්ඣිමනිකාය, මූලපරියායවග්ග, ඡජක්කසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 205 පිටුව.
27. මජ්ඣිමනිකාය, ඔපම්මවග්ග, අලගද්දූපමසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 346-7 පිටු.
28. වික්‍රමසිංහ, කේ.ඩී.පී. සම්බුදු දහම, කර්තෘ ප්‍රකාශිත, 1976, 258 පිටුව.
29. සංයුක්තනිකාය, මාර සංයුක්ත, පත්තසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 206-7 පිටු.
30. මජ්ඣිමනිකාය II, රාහුලොවාදසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 142-3 පිටු.
31. මජ්ඣිමනිකාය, මහායමකවග්ග, චූලවෙදල්ලසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 704-5 පිටු.
32. 'රූපං භික්ඛවෙ අනිච්චං, වෙදනා අනිච්චං, සඤ්ඤා අනිච්චා, සංඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චං, රූපං භික්ඛවෙ අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සංඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා, සබ්බෙ සංඛාරා අනිච්චා, සබ්බෙ ධම්මා අනත්තාති' මජ්ඣිමනිකාය, මහායමකවග්ග, චූලසච්චකසුත්ත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 543-4 පිටු.
33. බුද්දකනිකාය I, ධම්මපදය, මග්ගවග්ග, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006
34. අංගුත්තරනිකාය, තිකනිපාත, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 2006, 200-1 පිටු.
35. රාහුල හිමි, වල්පොල, බුදුන් වදාළ ධර්මය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 10, 1965, 76 පිටුව.